# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,635/16 — 1966 මාර්තු 10 වැනි බ්‍රහස්පතින්ද — 10.3.1966**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්.ඩී.—සීඇෆ්. 1/64.

අ. ආ. කා. අංකය : ඩබ්ලිව්. 68/66 (3)

**මහාජන ආරක්ෂක අඥපනත**

රාජ්‍ය ඇමතිවරයාගේ නිර්දේශය අනුව, මහාජන ආරක්ෂක ආඥපනතෙහි 5 වැනි වගන්තිය යටතේ පනවනු ලැබූ නියෝග.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාරවරයා.

1966 මාර්තු 10,
අග්‍රාණ්ඩුකාරවරයාගේ කායර්‍යාලය,
කොළඹ.

**නියෝග**

1. මේ නියෝග 1966 ආනයනය කරනු ලැබූ භාණ්ඩ පැවරීමේ (හදිසි) නියෝග යනුවෙන් හැඳින්විය හැකිය.

2. මුදල් ඇමතිවරයා ස්වකීය පරම අභිමතය අනුව, මහාජන ජීවිතය සඳහා අවශ්‍ය සැපයීම් හා සේවාවන් පවත්වා ගෙනයාම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක, ලංකාවට ආනයනය කරනු ලැබූ යම් බඩු තොගයක් හෝ එබඳු බඩු තොගයක යම් කොටසක් ඔහු විසින් ආඥවකින් රජය වෙත පැවරිය හැකිය.

3. අවස්ථාවෝචිත පරිදි, යම් බඩු තොගයක් හෝ යම් බඩු තොගයක කොටසක් සම්බන්ධයෙන් 2 වැනි නියෝගය යටතෙහි ආඥවක් පනවනු ලැබූ අවස්ථාවක, ඒ බඩු තොගය හෝ ඒ බඩු තොගයෙහි කොටස, බැඳීම්වලින් තොරව සම්පූර්ණයෙන් රජය වෙත පැවරී තිබිය යුතු අතර, මුදල් ඇමතිවරයා විසින් නිශ්චය කළ හැකි පරිදි, ඒවා සම්බන්ධයෙන් සුදුස්සක් ද කළ හැකි ය.

4. (1) 2 වැනි නියෝගය යටතෙහි පනවනු ලැබූ යම් ආඥවකින් යම් බඩු තොගයක් හෝ එබඳු බඩු තොගයක කොටසක් රජය වෙත පවරනු ලැබූ අවස්ථාවක ඒ වෙනුවෙන් ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීමක් අනුව මුදල් ඇමතිවරයා විසින් රජය වෙනුවෙන්, එකී බඩු තොගයෙහි හෝ ඒ කොටසෙහි ඉන්වොයිස් වටිනාකමෙන් සියයට දහයකට සමාන ගණනකුත් සමඟ එකී ඉන්වොයිස් වටිනාකමට සමාන වටිනාකමක්, ඒ බඩු තොගයෙහි හෝ ඒ කොටසෙහි ආනයනයකරු වෙත, වන්දි මුදල් වශයෙන් ගෙවිය යුතුය.

(2) රජය වෙත පවරා ඇති යම් බඩු තොගයක් හෝ එහි කොටසක් සම්බන්ධයෙන්, (1) වැනි ඡෙදයෙහි විධිවිධාන අනුව වූ මුදල් ඇමතිවරයා විසින් වන්දි මුදල් ගෙවා ඇති අවස්ථාවක, ඒ ගෙවීම, ඒ වන්දි මුදල සම්බන්ධයෙන් රජයේ වගකීම සම්පූර්ණයෙන් නිදහස් කිරීමක් විය යුතු අතර, එසේ යයි සැලකිය යුතුය.

(3) (1) වැනි ඡෙදය යටතේ වන්දි මුදල ගෙවිය යුතු යම් තැනැත්තකු විසින්, ඒ වන්දි මුදල ඔහුට දෙනු ලැබූ විට එය පිළිගැනීම ප්‍රතික්ෂෙප කරන හෝ ඒ තැනැත්තා මියගිය හෝ සොයාගත නොහැකි අවස්ථාවක, හෝ ප්‍රස්තුත බඩු තොගයේ හෝ එහි කොටසක් ආනයනය කරන්නා සම්බන්ධයෙන් මත භේදයක් ඇති අවස්ථාවක, හෝ වන්දි මුදල සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර නැති අවස්ථාවක ඒ ඡෙදය යටතේ ගෙවිය යුතු වන්දි මුදල, ඒ වන්දි මුදල රුපියල් හත්සිය පණහකට වැඩි හෝ අඩුවීම අනුව කොළඹ ප්‍රදේශ අධිකරණයේ හෝ කොළඹ සුළු විවාද අධිකරණයෙහි තැන්පත් කළයුතු අතර ප්‍රස්තුත අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ඒ අධිකරණයේ මතය අනුව එය ලැබීමට හිමිකම් ඇති තැනැත්තා විසින් ලබාගත යුතුය.

(4) (3) වන ඡෙදයේ විධිවිධාන යටතේ කොළඹ ප්‍රදේශ අධිකරණයෙහි හෝ කොළඹ සුළු විවාද අධිකරණයෙහි යම් වන්දි මුදලක් තැන්පත් කරනු ලැබූ අවස්ථාවක, (1) වන ඡෙදය යටතේ ආනයනය කරන්නා වෙත ගෙවිය යුතු වන්දි මුදල රජය විසින් ගෙවනු ලැබූ සේ සැලකිය යුතුවාත් හැර ඒ අනුව ඒ තැන්පත් කිරීම ඒ වන්දි මුදල සම්බන්ධයෙන් රජයේ වගකීම සම්පූර්ණයෙන් නිදහස් කිරීමක් වියයුතු අතර, එසේ යයි සැලකිය යුතුය.

5. (1) 2 වන නියෝගය යටතේ යම් බඩු තොගයක් හෝ එහි කොටසක් රජයට පවරමින් ආඥවක් පනවනු ලැබ ඇති අවස්ථාවක මුදල් ඇමතිවරයා විසින් ඒ වෙනුවෙන් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් එකී බඩු තොගය හෝ එහි කොටසක් ස්වාමිත්වයට ගතහැකි අතර එසේ ස්වාමිත්වයට ගැනීම සඳහා අවශ්‍ය සියලු කටයුතු කළ හැකිය.

(2) (1) වන ඡෙදයෙහි සඳහන් යම් නිලධරයකු විසින් තම යුතුකම් ඉටු කිරීමෙහි ලා හෝ ඒ ඡෙදය යටතේ තම අයිතිවාසිකම් පාවිච්චි කිරීමෙහි ලා ඔහුට අවහිර හෝ බාධා කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතුය.

6. වෙනත් ලිඛිත නීතියක විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද මේ නියෝග බලපැවැත්විය යුතුය.


ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසි වල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

358/49—ආර් 12835—11,750 (66/3)